0 14

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපන අධ්‍යයන අංශය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන - 2022/2023
අවසාන පරීක්ෂණය - 2023
**SNP8348/SNP8338** - අධ්‍යාපනයේ මාර්ගෝපදේශය හා උපදේශනය
කාලය - පැය තුනයි. (03)

---

දිනය - 15.12.2023 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලටද 2 වන කොටසෙහි ප්‍රශ්නවලින් ඕනෑම ප්‍රශ්න තුනකටද (03) පිළිතුරු සපයන්න.

<u>1 වන කොටස</u>

01. ශ්‍රී ලාංකීය සන්දර්භය වෙත සුවිශේෂී ලෙස යොමු දක්වමින් පාසල් පද්ධතිය තුළ මාර්ගෝපදේශ හා උපදේශන සේවා සඳහා අවශ්‍යතාවයක් නිර්මාණය කර තිබෙන සාධක දෙකක් (02) කෙටියෙන් විශ්ලේෂණය කරන්න.

02. විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සමඟ කටයුතු කරන විට ගුරුවරයෙකුහට සමායෝගී බව පිළිබඳ දැනුම ප්‍රයෝජනවත් වන ආකාරය උදාහරණ දෙකක් (02) දක්වමින් කෙටියෙන් විස්තර කරන්න.

03. පාසල් මාර්ගෝපදේශ හා උපදේශන සේවාව හා සම්බන්ධ මූලික ක්‍රියාවලි දෙකක් (02) නම් කර විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමුන් සඳහා පහසුකම් සැපයීමෙහි දී ඒවායේ උපයෝගීතාවය සාකච්ඡා කරන්න.

04. උදාහරණ දෙකක් (02) දක්වමින් සුවිශේෂී ගැටළු සඳහා උපදේශන සේවා සැපයෙන ක්ෂේත්‍රයක් ලෙස ව්‍යසන උපදේශනයෙහි (Trauma counselling) වැදගත්කම පැහැදිලි කරන්න.

05. විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ට උපදේශන සේවා සැපයීමෙහි දී උපදේශන ශිල්පක්‍රම භාවිතයෙහි ප්‍රතිලාභ දෙකක් (02) සාකච්ඡා කරන්න.

06. වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ පාසල් පද්ධතියෙන් බැහැරව ක්‍රියාත්මක වන මාර්ගෝපදේශ හා උපදේශන සේවාවක් (01) නම් කර පාසල් පද්ධතියෙහි පාර්ශවකරුවන්හට උපකාර කිරීමෙහි ලා එහි භූමිකාව අගයන්න.

07. "වෘත්තීය උපදේශනය, විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමුන් සඳහා හිතකර සහ සාර්ථක අනාගතයක් ගොඩනඟා ගැනීමට උපකාරී වේ."

    විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමුන්හට වෘත්තීය මාර්ගෝපදේශය සැපයීමෙහි අවශ්‍යතාවය අවධාරණය කරමින් මෙම ප්‍රකාශය සාධාරණීකරණය කරන්න.

08. උපදේශනයෙහි පුද්ගල කේන්ද්‍රීය ප්‍රවේශයෙහි මූලික දර්ශනය පැහැදිලි කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාවලිය අරභයා ද්විතියික පාසල් ශිෂ්‍යයින් මුහුණ දෙන ගැටළු හතරක් (04) ලැයිස්තුගත කරන්න. (ලකුණු 01 x 04 = 04)

(ii) ද්විතියික පාසල් වියෙහි පසුවන ශිෂ්‍යයින්ගේ සංවර්ධනාත්මක ලක්ෂණ අවම වශයෙන් තුනක් (03) වත් අවධාරණය කරමින් එම අවධිය ශිෂ්‍යයින්ගේ ජීවිතයෙහි වැදගත් කාලපරිච්ඡේදයක් ලෙස සලකනු ලබන්නේ මන්ද යන්න විභාග කරන්න. (ලකුණු 06)

(iii) ඔබ, ඔබේ පාසලේ උපදේශන ඒකකය භාර ගුරුවරයා/වරිය බව සිතන්න. ඔබ මීළඟ ගුරු-මාපිය රැස්වීම සඳහා පාසලට පැමිණෙන 08 හා 09 වන ශ්‍රේණිවල ශිෂ්‍යයින්ගේ දෙමාපියන්හට ඔවුන්ගේ දරුවන්ට පාසල් මාර්ගෝපදේශ හා උපදේශන සේවය පිළිබඳ ව ඇති අවශ්‍යතාවය අරභයා කථා කිරීමට සැලසුම් කරමින් සිටින්නෙහි ය. හැඳින්වීම, අවධාරණය කළ යුතු ප්‍රධාන කරුණු (අවම වශයෙන් හතරක් [04] වත්) සහ අවසාන වශයෙන් සිදු කරන ප්‍රකාශ ඇතුළත් වන සේ ඔබේ කථාවෙහි සටහනක් සකස් කරන්න. (ලකුණු 10)

10.(i) සුදුසු උදාහරණ දෙකක් (02) දක්වමින් "හැසිරීම් ගැටළු" යන සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) ළමුන් තුළ හැසිරීම් ගැටළු වර්ධනය වීමට හේතු වන පාසල් පරිසරය හා සම්බන්ධ සාධක තුනක් (03) හඳුනාගෙන එම එක් එක් සාධකය එබඳු හැසිරීම් ගැටළුවලට හේතු විය හැකි ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 02x 03 = 06)

(iii) ඔබට සම්මන්ත්‍රණයක දී හැසිරීම් ගැටළු සහිත ළමුන් පිළිබඳ ව ඔබේ වෘත්තීය සගයින් ඇමතීමට ආරාධනා කරනු ලැබ ඇතැයි සිතන්න. එබඳු ළමුන් සමඟ කටයුතු කිරීමෙහි දී ගුරුවරයෙකු විසින් යොදාගත හැකි ප්‍රධාන උපාය මාර්ග හතරක් (04) වත් අවධාරණය කරමින් ඔබේ කථාව ලියා දක්වන්න. (ලකුණු 10)

11.(i) 'කායික නො හැකියා' යන සංකල්පය සහ කායික නො හැකියා ඇති වීමට හේතු විය හැකි ප්‍රධාන සාධක දෙක (02) පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) කථන ඌනතා සහිත ළමුන්ගේ පොදු ලක්ෂණ තුනක් (03) විස්තර කරන්න. (ලකුණු 02x 03 = 06)

(iii) ඔබේ පංතියෙහි කථන ඌනතා සහිත ශිෂ්‍යයින් දෙදෙනෙකු සිටින බව සිතන්න. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ඔවුන් සඳහා පහසුකම් සැපයීමට ඔබ විසින් යොදා ගනු ලැබිය හැකි උපාය මාර්ග තුනක් (03) සාකච්ඡා කරන්න. (ලකුණු 10)

12. (i) 'ඉගෙනුම් දුෂ්කරතා' යන පදය පැහැදිලි කර 'ඉගෙනුම් නොහැකියා' යන සංකල්පය සමඟ එහි ඇති සබඳතාවය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) "ඉගෙනුම් දුෂ්කරතා සහිත ළමුන්ට ඔවුන්ගේ ගුරුවරුන්ගෙන් විශේෂ සහායක් අවශ්‍ය වේ." ප්‍රධාන කරුණු තුනක් **(03)** මත පදනම් ව ඉහත ප්‍රකාශය සාධාරණීකරණය කරන්න. (ලකුණු 02x 03 = 06)

(iii) ඔබේ පස්වන ශ්‍රේණියේ පංතියෙහි ඉගෙනුම් දුෂ්කරතා සහිත ළමුන් කිහිප දෙනෙක් සිටින බව සිතන්න. පංතිභාර ගුරුවරයා ලෙස ඔබ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ඔවුන්ගේ සංවර්ධනය සුසාධ්‍ය කරන්නේ කෙසේ ද? ඔබ විසින් යොදා ගනු ලැබිය හැකි උපාය මාර්ග හතරක් **(04)** අවධාරණය කරමින් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

13.(i) උපදේශනයේ චර්යාවාදී ප්‍රවේශයෙහි මූලික දර්ශනය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) සේවාලාභියෙකු හට ප්‍රතිකාර කිරීම සඳහා උපදේශකවරයෙකු විසින් යොදා ගනු ලැබිය හැකි ප්‍රධාන චර්යාමය ක්‍රියාමාර්ග තුනක් **(03),** එම එක් එක් ක්‍රියාමාර්ගය ඔස්සේ විසඳිය හැක්කේ කුමනාකාර ගැටළු ද යන්න දක්වමින් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 x 03 = 06)

(iii) සුවිශේෂී ගැටළු සහ සංවර්ධනාත්මක පසුබෑම් සහිත පාසල් ළමුන්හට උපකාර කිරීමෙහි දී උපදේශනයේ චර්යාවාදී ප්‍රවේශයෙහි දායකත්වය අගයන්න. (ලකුණු 10)

14. (i) එලි ගින්ස්බර්ග් විසින් ඔහුගේ වෘත්තීය තේරීම් පිළිබඳ න්‍යායෙහි දක්වා ඇති පරිදි පුද්ගලයෙකුගේ වෘත්තීය තේරීමෙහි ස්වාභාවය පැහැදිලි කරන්න. (ලකුණු 04 )

(ii) 'යථාර්ථ තේරීම්' කරන අවධියෙහි අනු-අවධි තුන **(03)** වෙත යොමු දක්වමින් එම අවධිය තුළ පුද්ගලයෙකුගේ වෘත්තීය තේරීම් විකාශනය වන ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 06)

(iii) පශ්චාත් නව යොවුන් වියෙහි පසුවන ශිෂ්‍යයින් හට, ඔවුනට සුදුසු වෘත්තීය මාර්ගයක් තෝරා ගැනීම සඳහා උපකාර කිරීමෙහි දී ගින්ස්බර්ග්ගේ වෘත්තීය තේරීම් පිළිබඳ න්‍යායෙහි උපයෝගීතාවය විභාග කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.